(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(4).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 පෙබරවාරි 18 සිකුරාදා**

**2022 මාර්තු 08 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

250/2022

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා අනුමත දුම්රිය ෂන්ටින් රියදුරු සංඛ්‍යාව සහ රියදුරු සහායක සංඛ්‍යාව;

(ii) මේ වනවිට සේවය කරනු ලබන දුම්රිය ෂන්ටින් රියදුරු සංඛ්‍යාව සහ රියදුරු සහායක සංඛ්‍යාව;

(iii) ඉහත තනතුරුවල මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණි ගඟ ආශ්‍රිතව ස්ථාපිත කර ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කර්මාන්තශාලාවලින් ඉවතලන අපවිත්‍ර ජලය එම ගඟට එක්කරනු ලබන බව දන්නේද;

(iii) එම අපවිත්‍ර ජලය හේතුවෙන් කැළණි ගං ජලයට සිදු වන හානිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) අපවිත්‍ර ජලය කැළණි ගඟට මුදා හැරීම වැළැක්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1471/2022

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර නගරයේ ආයුර්වේද රෝහලක් ස්ථාපිත කර ඇති බවත්;

(ii) වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා එම රෝහලට දිනපතා විශාල පිරිසක් පැමිණෙන බවත්;

(iii) එම රෝහල් ඉඩමේ පිටුපස කොටස කිසියම් පිරිසක් විසින් කම්බි ගසා අත්පත් කර ගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 මාර්තු 09 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

251/2022

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථාපනය කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව සහ ඒවායේ නම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රත්නපුර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා සමානව බෙදී යන අයුරින් ජාතික පාසල් ස්ථාපනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

571/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, මහියංගන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රටකජු වගා කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා තෝරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය සහ පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පවුල් සඳහා රජය විසින් ලබා දෙනු ලබන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1024/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ශිෂ්‍යභට බලකාය, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම බලකාය යටතේ පවතින බලඇණි සංඛ්‍යාව කොපමණද;

(ii) ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා 2021 වර්ෂයේ වෙන් කර තිබූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ජාතික ශිෂ්‍යභට බලකාය යටතේ පවතින පාසල් බණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බණ්ඩ සංඛ්‍යාව යුද, ගුවන්, නාවික සහ පොලිස් යනාදී වශයෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) පාසල් ශිෂ්‍යභට බලකාවල කටයුතු විධිමත් කිරීමට නව පියවර අනුගමනය කරන්නේද;

(ii) ජාතික ශිෂ්‍යභට බලකායේ ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානය වන රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ පවතින අඩුපාඩු සඳහා පිළියම් යෙදීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1314/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 රෝගය මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එන්නත්කරණය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) මේ දක්වා එන්නත්කරණයට ලක් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ලබා දී ඇති එන්නත් මාත්‍රාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ එන්නත්කරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 මාර්තු 10 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

8/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා නව නීති පැනවීමට අදහස් කර තිබේද;

(ii) අධිකරණ අමාත්‍යවරයා විසින් සිංගප්පූරු රජය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් පවත්වා ඇති බව පිළිගන්නේද;

(iii) සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

37/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කැරම් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කරන ලද මුදල;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ කැරම් ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැරම් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා වන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික කැරම් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

252/2022

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන ලද දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(v) "නෙළුම් කුලුන" නැරඹීම සඳහා ජනතාවට විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "නෙළුම් කුලුන" ව්‍යාපෘතියේ මේ වනවිට සිදු කර ඇති ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයෝජනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා එම ව්‍යාපෘතිය යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

572/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(ii) මේ වනවිට එම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ව්‍යාපාරිකයන් සහ එම ආර්ථික මධ්‍යස්ථානවලට සිය නිෂ්පාදන සපයනු ලබන ගොවීන් ඉතා අසරණ තත්වයකට පත් වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ආර්ථික මධ්‍යස්ථානවලට නිෂ්පාදන සපයනු ලබන ගොවීන් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1025/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමූපකාර ග්‍රාමීය බැංකු පද්ධතිය මඟින් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් සිදු කරනු ලබන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ පවතින සමූපකාර ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) සමූපකාර ග්‍රාමීය බැංකු මඟින් මේ වනවිට ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම කවරේද;

(iii) සමූපකාර ග්‍රාමීය බැංකු පද්ධතියේ මේ වනවිට තැන්පත් කර ඇති මුළු මුදල කොපමණද;

(iv) එම තැන්පතු මුදල් ග්‍රාමීය බැංකුව විසින් ප්‍රතිතැන්පත් කර ඇත්තේ රාජ්‍ය බැංකුවල ද පෞද්ගලික බැංකුවල ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සමූපකාර පොදු අරමුදලේ ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් ආයෝජනය කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1182/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සේවය කරනු ලබන කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත කර ඇති ආකාරය කවරේද;

(iii) එම තනතුරේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

(v) උතුරු පළාත සඳහා ඉහත නිලධාරීන් පත් කර නොමැති බව දන්නේද;

(vi) උතුරු පළාත සඳහා එම නිලධාරීන් පත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ට නව සේවා ව්‍යවස්ථාවක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එය සකස් කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එය සකස් කරනු ලබන දිනය හා ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඇතැම් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් ගණනයේදී, ඔවුන් ගොවි නියාමක සහ සමෘද්ධි නියාමක ලෙස කටයුතු කරන ලද සේවා කාලය සැලකිල්ලට ගෙන නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට එම සේවා කාලය ලබා දෙනු ලබන ආකාරය හා දිනය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1194/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ප්‍රදේශයේ ආරම්භ කරන ලද ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබාදීමේදී අය කරන ලද මුදල කොපමණද;

(iii) එම ඉඩම්වල අයිතිය පැවති පාර්ශ්වයේ නම කවරේද;

(iv) ඉහත කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා එම ඉඩම් පවරා දෙන ලද ගැසට් පත්‍රයේ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1315/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් (Central Investment and Finance PLC -CIFL) නමින් වූ මූල්‍ය ආයතනයක් සඳහා ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසරයක් ලබා දී තිබුණේද;

(ii) එම ආයතනය විසින් සිය තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ඔවුන්ට ගෙවා නොමැති බව දන්නේද;

(iii) එම ආයතනය බුන්වත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iv) එම පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඉහත තැන්පත්කරුවන්ගේ මුදල් නැවත ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1472/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2021 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද ගොවීන්ට දෙනු ලබන සහන කවරේද;

(iv) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වී ගොවිතැන ප්‍රචලිත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා හේතු වූ සාධක කවරේද;

(iii) විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා ඉහළ නැංවීම හේතුවෙන් වයස අවුරුදු 55 සම්පූර්ණ වීමේදී, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම අහිමි වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 මාර්තු 11 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතියක් ලබා දී තිබේද;

(ii) ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ අදාළ පාර්ශ්වයන් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබේද;

(iii) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් රජයේ ඉදිරි වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

38/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) එම කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සහ නිෂ්පාදන අළෙවි කර ගැනීමේ ගැටලු පවතින බවත්;

(iii) එම කර්මාන්තය මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් උපයාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, වර්ෂ 2015දී එමඟින් උපයාගන්නා ලද විදේශ විනිමය ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාව වේවැල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, ඒවා අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

253/2022

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ බිත්තර අපනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iii) ඉහත කාලය තුළ බිත්තර ආනයනය කරනු ලැබුවේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

573/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුකුළු පැටව් ජනිත කරවීම සඳහා වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මව් සතුන් සංඛ්‍යාව;

(ii) එම මව් සතුන් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මව් සතුන් ආනයනය කිරීම සම්බන්ධයෙන් යම් සීමාවක් පැනවීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපාන ලද සාධක කවරේද;

(iii) එම සීමා කිරීම, ශ්‍රී ලංකාවේ බිත්තර මිල හා කුකුළු මස් මිල කෙරෙහි ඇති කරනු ලබන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ අරමුණ ඇතිව සීමාසහිත ලංකා සළුසල ආයතනය ස්ථාපිතකර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ආයතනයේ පාලන ව්‍යුහය කවරේද;

(ii) 2019 හා 2020 වර්ෂවලදී එම ආයතනය විසින් දේශීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) 2019 හා 2020 වර්ෂවලදී එම ආයතනය ලැබූ ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සීමාසහිත ලංකා සළුසල ආයතනය ස්ථාපනය කිරීමේ අරමුණ සඵල වී තිබේද;

(ii) එම මූලික අරමුණ සාක්ෂාත් කරගැනීමට සහ එම ආයතනය වර්තමානයට ගැලපෙන ලෙස නවීකරණය කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1185/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත හේවාගම් කෝරළයේ හංවැල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ විශාල මුදල් වංචාවක් සිදු වී ඇති බවත්;

(ii) ප්‍රදේශයේ විහාරස්ථානවල හා සාමාන්‍ය ජනතාවගේ මුදල් එම සමූපකාර සමිතියට අනුබද්ධ ග්‍රාමීය බැංකුවල තැන්පත් කර ඇති බවත්;

(iii) එම තැන්පත්කරුවන්ට කිසිදු මුදලක් නැවත ලබා ගැනීමට නොහැකි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතිය විසින් වංචා කර ඇති මුදල කොපමණද;

(ii) තම මුදල් ලබාගැනීමට නොහැකි වූ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වංචාව සිදු කර ඇති ආකාරය පැහැදිලි කරන්නේද;

(iv) එම වංචාවට වගකිව යුතු අය හඳුනාගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මුදල් වංචාවට ඉහත සමිතියේ එවකට අධ්‍යක්ෂ මණ්ඩලය, සමූපකාර දෙපාර්තමේන්තු නිලධාරීන් හා පෞද්ගලික සමාගමක් වගකිය යුතු බව දන්නේද;

(ii) ඔවුන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ නම්, ඒවා කවරේද;

(iii) ඔවුන්ගෙන් මුදල් අයකර තැන්පතුකරුවන්ට සහන සැලසීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1195/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ, වගවත්ත ප්‍රදේශයේ ආරම්භ කරන ලද ටයර් කර්මාන්තශාලාව ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා වූ ගිවිසුම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ අත්සන් කරන ලද දිනය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය මඟින් බිහි කරනු ලබන රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1316/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා යෝජිතව තිබූ දිනය;

(iii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත දිනය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා තවදුරටත් වැය කළ යුතු මුදල කොපමණද;

(iii) ඉහත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන සමාගම කවරේද;

(iv) පසුගිය රජය සමයේදී එම ව්‍යාපෘතියට අදාළව අක්‍රමිකතා සිදු වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1473/2022

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර-ඇතුළු නුවර පදිංචි වී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට මේ දක්වා නීත්‍යානුකූල පදිංචිය ලබා දී නොමැති බව දන්නේද;

(iii) එසේ නම්, එම පුද්ගලයන්ට නීත්‍යානුකූල පදිංචිය ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1732/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මේ වනවිට වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වකුගඩු රෝගීන් අතරින් මාසික වකුගඩු රෝගී දීමනාව ලබා දෙනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත දීමනාව ලබා ගැනීම පිණිස පොරොත්තු ලේඛනයේ සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොරොත්තු ලේඛනයේ සිටින වකුගඩු රෝගීන්ට ඉහත දීමනාව කඩිනමින් ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?